# හදිසි අවස්ථා තත්ත්වයක් තේරුම් ගැනීම : අප්‍රේල් 2019

2019 අප්‍රේල් මස 21 වන දින සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගෙන් පසු අප්‍රේල් 23 වන දින රටේ පෙල ගැසෙමින් පැවති ආරක්ෂක තත්ත්වය පිළිබඳව කටයුතු කරණු පිණිස ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත්කරන ලදී. රජය විසින් අත්කරගනු ලබන සුවිශේෂ බලතල අන්තර්ගත වූ විස්තෘත හදිසි අවස්ථා රෙගුලාසීන් ද අප්‍රේල් 24 වන දින නිකුත් කරනු ලැබිණි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙම කෙටි ලියැවිල්ල සකස් කරන ලද්දේ වර්තමානයේ බල පවත්වනු ලබන හදිසි තත්ත්වය මූලික අයිතිවාසිකම් සහ ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යකරණයකෙරෙහි වක්‍ර බලපෑම් අතිකරනු ලබන හදිසි අවස්ථා රෙගුලාසීන්හිඅන්තර්ගත වන ප්‍රධාන ප්‍රතිපාදනයන් යනාදිය පිළිබඳව වූ මූලික තොරතුරු අවබෝධකරගැනීමට උපකාරීවනු පිණිසයි.

## 1 කොටස - හදිසි අවස්ථා තත්ත්වය

1. **"හදිසි අවස්ථා තත්ත්වය" යනු කුමක් ද?**

හදිසි අවස්ථාව යන්න මහජන ආරක්ෂක පනතෙහි විස්තර කෙරෙන්නේ අනතුරක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට සාමාන්‍ය තත්ත්වයන්හීදී ලබා දෙනු නොලබන බලතල රජයට ලබාදිය හැකි සුවිශේෂ තර්ජනයක් අනතුරක් හෝ ව්‍යසනයක් පැහැදිලි ලෙසම පවතින තත්ත්වයක් ලෙසය. මෙවැනි තත්ත්වයකදී ජාතික ආරක්ෂාව, මහජන සාමය සහ අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වාගෙන යෑම සහතික කිරීම පිණිස හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත්කිරීම පිණිස ජනාධිපතිවරයාට ඉඩ ලැබේ.

2. **හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමේ බලය ලැබෙන්නේ කොහේ සිට ද සහ එම තත්ත්වය ප්‍රකාශයට පත්කල හැක්කේ කවුරුන් හට ද?**

නිවේදනයක් මගින් හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත්කිරීමේ තනිකරවූ අභිමතානුසාරී බලය ජනාධිපතිවරයා සතුව පවතී (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ව්‍යවස්ථාව). එම නිවේදනයපාර්ලිමේන්තුව වෙත සන්නිවේදනය කළ යුතු වන අතර ඒ සඳහා පාර්ලිමේන්තුව කැඳවීම ද කළයුතු වේ. හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත්කිරීම අධිකරණයකදී අභියෝගයට ලක්කළ නොහැකි වේ. ජනාධිපතිවරයාට හදිසි අවස්ථා රෙගුලාසි සකස් කිරීමට ඇති බලය ඇතුළු මහජන ආරක්ෂක පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක බවට පත්වීම හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත්කිරීම මගින් සිදුවේ. මෙම රෙගුලාසි මගින් අනෙක් ඕනෑම නීතියක් අක්‍රීය කල හැකි වන නමුදු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අක්‍රීය කිරීමට ඒවාට නොහැකි වේ.

3. **හදිසි අවස්ථා තත්ත්වයක් කොපමණ කාලයක් පැවතිය හැකි ද?**

මාසයක කාලයක් වලංගු වන නිවේදනයන් නිකුත් කිරීමට ජනාධිපතිවරයාට හැකිය (මාසයක් ගතවීමට පෙර එය අවලංගු කිරීමට ඔහුට හැකිවන නමුත්). දින 14 ක් ඇතුළතඑම නිවේදනය පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතුවේ. එසේ සිදු නොවුවහොත් නිවේදනය අවලංගුවේ. සෑම දින 30 කටම වරක් හදිසි අවස්ථා තත්ත්වය දීර්ඝ කළ හැකිය. නමුත් එසේ කල හැක්කේ පාර්ලිමේන්තු අනුමැතියෙනි. අප්‍රේල් 24 වන දා ඡන්දයකින් තොරව මසක කාලයක් සඳහා පාර්ලිමේන්තුව විසින් හදිසි අවස්ථා තත්ත්වයක් අනුමත කරන ලදි.

4. **පුරවැසි අයිතිවාසිකම්කෙරෙහි හදිසි අවස්ථා රෙගුලාසි වලින් ඇතිවන බලපෑම කුමක්ද?**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කරන ලද ඇතැම් මූලික අයිතිවාසිකම් සහ අනෙක් නීතීන් වලින් පැන නගින අයිතීන් ගණනාවක් වෙත හදිසි අවස්ථා රෙගුලාසි මගින් සීමා කිරීම් පැනවේ. එම සීමාවන් එමගින් වැළැක්වීමට බලාපොරොත්තු වන හානියට සමානුපාතික වියයුතු බවට වන කිසිදු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අවශ්‍යතාවයක් නොපවතී. එහිදී වගකිවයුතු ලෙස ක්‍රියාකිරීම සම්පූර්ණයෙන්ම විධායකයේ හොඳහිත මත පවතින්නකි.

*සීමා කරනු ලැබිය හැකි මූලික අයිතිවාසිකම් වනුයේ :*

- නිර්දෝෂී බවට වන පූර්ව නිගමනය
- ඔප්පු කිරීමේ භාරය හා ප්‍රතිරෝධනීය දණ්ඩනය
- නීතිය ඉදිරියෙහි සමානත්වය සහ වෙනස්කම් නොකිරීම
- අත්අඩංගුවට ගැනීම සහ රඳවා ගැනීම සඳහා වන සාමාන්‍ය නෛතික ක්‍රියායලිය
- අදහස් ප්‍රකාශනයේ, රැස්වීමේ, සමාගම් පැවැත්වීමේ, ගමන් කිරීමේ, රැකියාවේ ආගමේ සංස්කෘතියේ සහ භාෂාවේ නිදහස කෙරෙහි අදාලවන මූලික අයිතිවාසිකම්

*හදිසි අවස්ථා රෙගුලාසි මගින් සීමා කළ නොහැක්කේ :*

- සිතීමේ සහ හෘදසාක්ෂියේ නිදහස
- වධ හිංසා පැමිණිවීමෙන් නිදහස
- නිසි බලතල සහිත අධිකරණයක් මගින් සාධාරණ නඩු විභාගයක් සඳහා ඇති අයිතිය(හදිසි අවස්ථා රෙගුලාසි මගින් පමුණුවනු ලැබිය හැකි නඩුවිභාගයකට පෙර රඳවා තබාගැනීම් හැරුණුවිට)

හදිසි අවස්ථා බලතල වලින් ස්වායත්ත ලෙස ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (PTA) උපයෝගී කොට ගැනීමේ හැකියාව රජය වෙත පවතී. මෙම ත්‍රස්ත විරෝධී බලතල විස්තෘත වන අතර හදිසි අවස්ථා බලතල මෙන් අඛණ්ඩ ලෙස පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමේ විධිමත් අවශ්‍යතාවයක් ද එම බලතල භාවිතයේදී නොපවතී.

## II කොටස - හදිසි අවස්ථා රෙගුලාසි

### 5. 2019 අප්‍රේල් 21 ප්‍රහාරයන් ගෙන් පසු ගැසට් කරන ලද හදිසි අවස්ථා රෙගුලාසි කුමන ඒවාද?

- **ගැසට් අංක 2120/3** -මහජන ආරක්ෂක පනතේ දෙවෙනි වගන්තිය කැඳවමින් ජනාධිපතිවරයා විසින් නිකුත් කල නිවේදනය
- **ගැසට් අංක 2120/4 -** විශේෂ කොට දක්වන ලද පළාත් වල මහජන සාමය පවත්වා ගැනීම සඳහා සන්නද්ධ හමුදාවන් කැඳවීම (මහජන ආරක්ෂක පනතේ 12 වන වගන්තිය යටතේ)
- **ගැසට් අංක 2120/5 -** මහජන ආරක්ෂක පනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සකස් කල රෙගුලාසි

### 6. හදිසි අවස්ථා රෙගුලාසි සාමාන්‍ය පුරවැසියන් හට බලපාන්නේ කෙසේද?

ත්‍රස්තවාදී ක්‍රියාවන්ට සම්බන්ධ වුවන් හෝ සැකකරුවන් නොවන සාමාන්‍ය පුරවැසියන්ගේ එදිනෙදා ජීවිතය, මෙම හදිසි අවස්ථා රෙගුලාසීන් බල පවත්වන විට දී ඒවායේ බලපෑමට ලක්වන ආකාරයන් ගණනාවක් පවතී.

පුරවැසියන් බලතල දරන අධිකාරීන් සමග සහයෝගීව කටයුතු කල යුතු ආකාරය මීට ඇතුළත්වේ.

- යම් පුද්ගලයෙකු වාසය කරන ගොඩනැගිල්ලක් හෝ පරිශ්‍රයක් මෙම රෙගුලාසි යටතට වැටෙන යම් වරදක් කිරීමට හෝ කිරීමට සම්බන්ධ යම් කටයුත්තකට භාවිත කරනු ලැබ තිබේ යැයි චෝදනා එල්ල වී ඇති විටෙක දී එම ප්‍රදේශය භාර පොලිස් අධිකාරීවරයාට ඔවුන් එම ස්ථානයෙන් ඉවත් කල හැකිය. මෙය සිදුවෙයි නම් එම ගොඩනැගිල්ල නිදහස් කර ගැනීම සඳහා ඔබට මහාධිකරණය වෙතින් නියෝගයක් ඉල්ලා සිටීමේ හිමිකම පවතී.

කුමන තත්ත්වයක් යටතේ දී හෝ මාස 06 යක් ඇතුළත එම පරිශ්‍රය අයිතිකරු වෙත නැවත ලබාදිය යුතු වේ **(රෙගුලාසි 8).**

- ජාතික ආරක්ෂාවේ යහපත පිණිස, මහජන සාමය ආරක්ෂා කිරීම පිණිස හෝ ප්‍රජාවේ ජන ජීවිතය සඳහා වන අත්‍යාවශ්‍ය සේවාවන් සහ සැපයුම් අඛණ්ඩව පවත්වා ගැනීම පිණිස අවශ්‍ය හෝ යෝග්‍යයයි නිසි බලධරයකු (මේ අවස්ථාවේදී සන්නද්ධ හමුදාවක හමුදාපතිවරයකු, පොලිස්පතිවරයා හෝ දිස්ත්‍රික් ලේකම්වරයකයන්න අදහස් වේ) එවැනි බලධරයකුට ශ්‍රී ලංකාවේ ඕනෑම වාහනයක් එවැනි සේවාවන් සඳහා ලබාදෙන ලෙස නියෝග කල හැකිය **(රෙගුලාසි 9).**
- ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් හෝ අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වාගෙන යෑම පිණිස හෝ යම් පුද්ගලයෙකුට යම් කාර්යයක් ඉටුකරන ලෙස හෝ යම් පුද්ගලික සේවාවක් ලබාදෙන ලෙස හෝ ඉල්ලීම් කිරීමට ජනාධිපතිවරයාට හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ බලධරයකුට හැකිය. එසේ කිරීමට අසමත්වීම වරදක් වනු ඇත **(රෙගුලාසි 10).**
- යම්කිසි සීමා කරන ලද ප්‍රදේශයන්ට, ස්ථානයන්ට හෝ පරිශ්‍රයන්ට ඇතුළුවීමට බලයක් නොමැති පුද්ගලයන් ඇතුළුවීම වැළැක්වීම වැනි විශේෂ ආරක්ෂක පියවරයන් ගැනීම අවශ්‍යයයි යන්න නිසි බලධරයෙකුගේ අදහස වන විටදී එවැනි පුද්ගලයන් එසේ ඇතුළුවීම වැළැක්වීමට ක්‍රියා කළ හැකිය. එවැනි යම් පුද්ගලයන් එවැනි ස්ථානයන්ට ඇතුළුවී නම් ඔවුන් ඉවත් කිරීමට බලයලත් පුද්ගලයෙකුට හැකිය **(රෙගුලාසි 12).**
- ප්‍රසිද්ධ පෙළපාලි හෝ රැස්වීම් පැවැත්වීම තහනම් කිරීමට ජනාධිපතිවරයාට හැකිය. නමුත් එම නියෝගයෙන්ම හෝ පසුව නිකුත් කරන නියෝගයක්මගින් ඊට ව්‍යතිරේකයන් එකතු කිරීමට ද ඔහුට හැකියාව ඇත. මහජන සාමය අවුල් කිරීමට හෝ අසහනකාරී තත්ත්වයක් ප්‍රවර්ධනය කිරීමට ඉඩ ඇතැයි තමාට හැඟී යන විටකදී යම් පෙළපාලී හෝ රැස්වීම් තහනම් කිරිමට නියෝග කිරීමට ද ජනාධිපතිවරයාට හැකිය **(රෙගුලාසි 13).**
- යම් ප්‍රසිද්ධ මාර්ගයක, දුම්රිය මාර්ගයක, විනෝද උයනක හෝ යම් වෙනත් පිට්ටනියක හෝ නිශ්චිත කොට දක්වන වෙනත් ගොඩනැගිල්ලක හෝ පරිශ්‍රයක මිනිසුන් ගැවසිය යුතු නැතැයි නියෝග කරමින් ඇඳිරි නීති නියෝග නිකුත් කිරීමට ද ජනාධිපතිවරයාට හැකිය. එවැනි නියෝගයකට ව්‍යතිරේකයන්, පසුකාලීන නියෝගයක් මගින් හෝ මුල් නියෝගයේම, එවැන්නකට අවසර දිය හැකියයි නිශ්චිත කොට දක්වන පුද්ගලයන් මගින් ඇති කිරීමට ජනාධිපතිවරයාට හැකිය **(රෙගුලාසි 14).**
- මුළු රටේම හෝ රටේ යම් ප්‍රදේශ වල යම් කරුණු පළකිරීම හෝ ශ්‍රී ලංකාවේ සිට යම් බාහිර රටවලට සම්ප්‍රේෂණය කිරීම සීමා කිරීමට නිසි බලධරයෙකු හට බලය පවරනු ලැබිය හැකිය.ඇතැම් විට එවැනි නියෝගයක ලියවිලි, චිත්‍ර, ඡායාරූප සහ සේයාපට ලබා ගැනීමට හෝ ආරක්ෂක හමුදාවල ක්‍රියාන්විතයන් පිළිබඳ කරුණු සම්ප්‍රේෂණ කිරීමට සම්බන්ධ පුවත් වාර්තා, කතුවැකි, ලිපි, කතෘට ලියුම්, කාටූන්, විවේචන පළකිරීමට පෙර එම නිසි බලධාරියා වෙත ඉදිරිපත් කිරීමට හෝ ඔහුට ප්‍රදර්ශනය කිරීමට අවශ්‍යයයි නියම කරන එම නිසි බලධරයා විසින් අවශ්‍යයයි හෝ යෝග්‍යයයි සලකන අතුරු ප්‍රතිපාදනයන්ද අන්තර්ගත විය හැකිය **(රෙගුලාසි 15 (1)).**
- සහකාර පොලිස් අධිකාරිවරයකුට පහළ නොවන නිලයක් දරන පොලිස් නිලධරයෙකු විසින් යම් නිවසක පදිංචි නිවැසියන්ගේ (පවුලේ සාමාජිකයන්, සේවකයන් සහ අනෙකුත් නිවැසියන්ගේන් වෙන්කොට දක්වමින්) ලැයිස්තුවක් ඉදිරිපත් කරන ලෙස ගෘහ මූලිකයෙකු හට නියම කළ හැකිය. එවැනි ලැයිස්තුවකට එකතු වන හෝ ඉන් ඉවත් වන පුද්ගලයන් පිළිබඳව වාර්තා කරන ලෙස හෝ තම ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපිතිවරයාට දැනුම්දීමකින් තොරව ආගන්තුකයන් තම නිවසේ පදිංචිකර නොගන්නා ලෙස ද ගෘහ මූලිකයෙකු හට නියෝග කිරීමට ද හැකිය **(රෙගුලාසි 23).**

**7. මාධ්‍යවෙත මෙම රෙගුලාසි මගින් ඇතිකෙරෙන බලපෑම කුමක් ද?**

පුරවැසියන් විසින් ප්‍රකාශයට පත්කළ හැකි දේ පිළිබඳව වන සීමා කිරීම් වලටඅමතරව රෙගුලාසි 15 (ප්‍රකාශණයන් පිළිබඳව වන පාලනය) මගින් මාධ්‍යය වෙත බලපෑමක් ඇතිවිය හැකිය.

ඉහත සඳහන් කරන ලද 15(1) රෙගුලාසිය යම් පුවත්පතක් විසින් උල්ලංඝණය කරනු ලැබුවොත් නිසි බලධාරියා විසින් එක් වරක් හෝ ඊට වැඩි වර ගණනක් අවවාද කිරීමෙන් අනතුරුව නියමයක් මගින් ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කාලය තුළ ඒ පුවත්පත කිසිම තැනැත්තෙකු විසින් මුද්‍රණය කිරීම, පළ කිරීම හෝ බෙදාහැරීම නොකළ යුතු බව හෝ මුද්‍රණයට කිරීමට හෝ බෙදාහැරීමට නිසිම අයුරකින් සම්බන්ධ නොවිය යුතු බවට සහ ඒ පුවත්පත් මුද්‍රණාලය නියමයෙහි නිශ්චිතව සඳහන් කාලය තුළ කවර හෝ කාර්යයන් සඳහා හෝ නියමයෙහි නිශ්චිතව සඳහන් යම් කාර්යයක් සඳහා හෝ පාවිච්චි නොකළ යුතු බවට ද විධාන කළ හැකිය **(රෙගුලාසි 15(3))**

රාජ්‍ය ආරක්ෂාවට හෝ මහජන සාමය රැකීමට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාමට හෝ හානිකර යැයි තම මතය පරිදි අදහස් කරන කරුණු හෝ හමුදා කැරළි ගැසීමට හෝ කැරළි කෝළහාල ඇති කිරීමට තැනැත්තන් පොළඹවන හෝ දිරිගන්වන කරුණු ඇතුළත් යම් ලේඛනයක් සකස් කිරීම සඳහා යම් මුද්‍රණාලයක් හෝ යම් තැනැත්තෙකුගේ පාලනය යටතේ වූ මුද්‍රණාලයක්, පාවිච්චි කරනු ලැබූ බව හෝ පාවිච්චි කරනු ලැබිය හැකි බව නිසි බලධරයෙකුගේ මතය වුවහොත් අවස්ථානෝචිත පරිදි ඒ මුද්‍රණාලය ඒ තැනැත්තාගේ පාලනය යටතේ පවත්නා මුද්‍රණාල සියල්ල හෝ ඉන් යම් මුද්‍රණාලයක් නියමය බලපවත්නා තෙක් කවර හෝ කාර්යයක් සඳහා හෝ නියමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කාර්යයක් සඳහා පාවිච්චි කරනු නොලැබිය යුතු යයි බලධරයා විසින් නියමයකින් විධානය කළ හැකිය **(රෙගුලාසි 15(7))**

ජනාධිපතිවරයා විසින් පත්කරන ලද උපදේශක කමිටු ඒකක හෝ වැඩිගණනක් තිබිය යුතුවන අතර යම් නියෝගයක් පිළිබඳව අතෘප්තිමත් වන්නා වූ පුද්ගලයන් හට ඒවාට තම විරෝධතාවය යොමුකල (රෙගුලාසි 15 (8)) හැකි විය යුතුය. තවද බලපෑමට පත් පුවත්පත් අයිතිකරුවෙකු හෝ මුද්‍රණාලහිමියකු හට ඍජු ලෙසට තම කරුණු ඉදිරිපත් කිරිම් ජනාධිපතිවරයා හට යොමුකිරීමට හැකිවන බවට නිසිබලධරයා විසින් සහතික කළ යුතුය **(රෙගුලාසි 18 (9)).**

**8. මෙම රෙගුලාසි යටතේ තීරණ ගැනීමේ බලතල පවතින්නේ කුමන අධිකාරීන් වෙත ද?**

**නිසි බලධරයා**

නිසි බලධරයා යනු කවරෙක් දැයි විවිධ විධිවිධාව වලට අනුව වෙනස් වෙයි. රෙගුලාසි 2(1) අනුව නිසි බලධරයා යනු යම් හදිසි අවස්ථා නියෝගයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට ඒ නියෝගයේ අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්තේ නම් මිස, ඒ නියෝගයේ කාර්යය සඳහා නිසි බලධරයෙකු වශයෙන් ජනාධිපතිවරයා විසින් නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් වේ. රෙගුලාසි 9(5) අනුව නම් නිසි බලධරයා යනු යුධ හමුදාපති, නාවික හමුදාපති, පොලිස්පති හෝ සෑම පරිපාලන දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් ලේකම්වරයා වේ. නිසි බලධරයා පත් කරන අවස්ථාවකදී රෙගුලාසි5(1) අනුව එම තැනැත්තා මුළු ශ්‍රී ලංකාවටම හෝ ඒ තැනැත්තා පත් කරනු ලබන ලියවිල්ලේ සඳහන් නිශ්චිත ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා පත් කරනු ලැබිය හැකිය. තවද ඒ පත්කිරීම ඒ ලියවිල්ලේ සඳහන් නිශ්චිත කාර්යය සඳහා සීමා කරනු ලැබිය හැකිය.

**උපදේශක කමිටු**

උපදේශක කමිටු වල බලතල සහ ක්‍රියාකාරීත්වයන් විවිධ රෙගුලාසි අනුව වෙනස් වේ. රෙගුලාසි 15(2)(b), 15(3) සහ 15(7) යටතේ නිකුත් කරන ලද නියෝගයක් පිළිබඳව අතෘප්තියට පත් යම් පුද්ගලයෙකු හට ජනාධිපතිවරයා විසින් පත්කරන ලද උපදේශක කමිටු එකකට හෝ වැඩිගණනකට තම විරෝධතාවයන් ඉදිරිපත් කිරීමට රෙගුලාසි 15(8) මගින් ඉඩකඩ සැලසේ. "උපදේශක කමිටු"මැයින් වූ රෙගුලාසි 16 මගින් රාජ්‍ය සේවකයන්, වෘත්තීය සමිතිවල නිලතල දරන්නන් සහ යම් ප්‍රජාවක පිළිගැනීමක් සහිත වෙනත් පුද්ගලයන්ගෙන් සමන්විත වූ කමිටුවක් සෑම ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාශයක් සඳහාම පත්කිරීමට ප්‍රාදේශීය ලේකම්වරයකු හට ඉඩකඩ සැළසේ. එම කොට්ඨාශය තුළ මහජන සාමය සුරක්ෂිත කිරීමත් අත්‍යාවශ්‍ය සේවාවක් පවත්වාගෙන යාමත් පිළිබඳව අදාළ අධිකාරීන් හට උපදෙස් දීම එබඳු සියලු කමිටුවල කාර්යය වන බව කියැවේ. ඊට සමාන ලෙස ජනාධිපතිවරයා විසින් පත්කරන ලද පුද්ගලයන්ගෙන් සමන්විත වන උපදේශක කමිටුවක් ද රෙගුලාසි 19(4) යටතේ පත් කරනු ලැබේ. රෙගුලාසි 19(1) යටතේ නිකුත් කරනු ලබන රැඳවුම් නියෝගයකින් අගතියට පත් ඕනෑම පුද්ගලයකු හට එබඳු කමිටුවකට තම විරෝධතාවන් ඉදිරිපත් කළ හැකිය.

9. **මෙම රෙගුලාසි මගින් ගෙන එනු ලැබ ඇති අළුත් වරදවල් මොනවාද?**

හදිසි අවස්ථා රෙගුලාසි V වන කොටස මගින් පුළුල් අළුත් වරදවල් සහ දඬුවම් ගණනාවක් හඳුන්වා දෙනු ලැබ තිබේ. හදිසි අවස්ථා රෙගුලාසි 25 සහ 45 යටතේ වන වරදවල් සඳහා මරණ දඬුවම හඳුන්වාදී තිබීම ද කනස්සල්ල දනවන සුළු තත්ත්වයකි. ජනතාවගේ අයිතිවාසිකම් මත අතිශය පුළුල් බලපෑමක් ඇති කළ හැකි පුළුල් වරදවල් සමහරක් පහත දැක්වේ.

***රෙගුලාසි 25***

- දේපළ විනාශ කිරීමේ හෝ ඒවාට හානි පැමිණවීමේ වරද.
- ගින්නෙන් හෝ පුපුරන ද්‍රව්‍යයකින්/ මිසයිලයකින් ආයුධයකින් හෝ උපකරණයකින් යම් පුද්ගලයෙකු හට මරණය හෝ තුවාල සිදුකිරීම හෝ එසේ කිරීමට උත්සාහ කිරීම.
- අනාරක්ෂිතව හෝ හිස්ව පවතින යම් පරිශ්‍රයක ඇති යම් දෙයක් සොරකම් කිරීම.
- දණ්ඩනීති සංග්‍රහයේ 427-446 වගන්ති යටතේ වනයම් වරදක් සිදු කිරීම.
- දණ්ඩනීති සංග්‍රහයේ 138 වගන්තිය ප්‍රකාර නිතීවිරෝධී රැස්වීමක සාමාජිකයකු වීම.
- යම් ද්‍රව්‍යයන් හෝ භාණ්ඩයන් සම්බන්ධව වරදක් කරනු ලැබ ඇතිබව දැනුවත්ව හෝ විශ්වාස කිරීමට හේතු සහිතව එවැනි ද්‍රව්‍යයන් හෝ භාණ්ඩයන් වංචා සහගත ලෙස ලබාගැනීම හෝ ලඟතබා ගැනීම.

ඉහත වැරදි සිදුකිරීම කරණ කොටගෙන යම් පුද්ගලයකු මහාධිකරණයක් ඉදිරියේ වරදකරුවකු වුවහොත් ඔහු <u>මරණ දඬුවමට යටත්වීමට</u> හෝ ජීවිතාන්තය දක්වා දෙයාකාරයකින් එක් ආකාරයකට සිරදඬුවම් ලැබීමට හැකිය.

- **රෙගුලාසි 29** -යම් පුද්ගලයෙකුට, කණ්ඩායමකට, පුද්ගලයන් කණ්ඩායමකට හෝ සංවිධානයකට ජාතික ආරක්ෂාවට අනර්ථදායී හෝ අගතිදායක යම් තොරතුරක් සැපයීම කිසිවකු විසින් නොකළ යුත්තේය. මෙම වරදට වරදකරුවන්නා වූ පුද්ගලයෙකු හට වසර පහක සිට වසර 10ක් දක්වා වූ කාලයක් පුරා සිරදඬුවමකට ලක් කල හැකිවනු ඇත.
- **රෙගුලාසි 30** -කථාකරනු ලබන/ලියනු ලබන/ගයනු ලබන හෝ දෘශ්‍ය ලෙස ප්‍රදර්ශනය කරනු ලබන වචන භාවිතයෙන් හෝ හැසිරීමකින් හෝ වෙනත් යම් ආකාරයක ක්‍රියාවකින් ශ්‍රී ලංකාවේ රජය පෙරළා දැමීමේ හෝ යටපත් කිරීමේ අවශ්‍යතාවය/ යෝග්‍යභාවය වෙනුවෙන්පෙනී සිටීම.
- **රෙගුලාසි 31** - ජාතික ආරක්ෂාවට/මහජන සාමයට/අත්‍යාවශ්‍ය වූ සැපයුම් සහ සේවාවන් පවත්වාගෙන යාමට හානිකරවූ අන්තර්ගයක් සහිත පෝස්ටර්/ පත්‍රිකා/ අත්පත්‍රිකා යනාදිය මහජනතාවට පෙනෙන ස්ථානයක සවිකිරීම්/ මහජනතාව අතර බෙදාහැරීම.
- **රෙගුලාසි 32** -යම් පුද්ගලයෙකු විසින් කට වචනයෙන් හෝ වෙනත් ඕනෑම අකාරයකින් මහජන අසමගියට හේතු විය හැකි යම් දූෂමාන ආරංචියක් සන්නිවේදනය කිරීම/ ව්‍යාප්ත කිරීම/ පැතිරවීම.
- **රෙගුලාසි 33** - රෙගුලාසි වලින් නිශ්චිත ලෙස දක්වා ඇති ඕනෑම කරුණු අන්තර්ගතයන් යම් ලියවිල්ලක් හෝ තැටි/ පටිගත කිරීමක් සේ මුද්‍රණය කිරීම ප්‍රකාශයට පත්කිරීම හෝ තොරතුරු ලබාදීම/ විවේචනයන් ඉදිරිපත් කිරීම/ යම් චිත්‍රානුසාරයෙන් ඉදිරිපත් කිරීමක්/ ඡායා රූපයක්/ සිනමාරූපයක් ලෙස ඉදිරිපත් කිරීම.

- **රෙගුලාසි 35 -** යමකු වැරදි බව දන්නා/ වැරදිබව සිතීමට සාධාරණ හේතු පවත්තා යම් තොරතුරක් ඉදිරිපත් කිරීම හෝ එවැන්නක් ඇතුළත් ප්‍රකාශයක් කිරීම.
- **රෙගුලාසි 36 -** රාජ්‍ය සංස්ථාවක් ඇතුළුව ආණ්ඩුවේ යම් කාර්යාලයකට, සංවිධානයකට, ආයතනයකට හෝ සංස්ථාවකට සම්බන්ධ නැතහොත් ඊට අදාළ හෝ පොලීසියේ හෝ සන්නද්ධ සේවාවන් හි සාමාජිකයන්, සේවයේ යොදවා ඇති ආකාරයට හෝ ඔවුන්ගේ වාසස්ථානයට සම්බන්ධ නැතහොත් අදාළ හෝ පොලීසියට හෝ සන්නද්ධ සේවාවන්ට අයත් ප්‍රවාහන සේවාවල, යුදායුධ හෝ වෙඩි ද්‍රව්‍ය වලට සම්බන්ධ නැතහොත් ඒවාට අදාළ යම් සිතියමක්, සැලැස්මක්, දළ සටහනක්, චිත්‍රයක් හෝ කටු සටහනක් හෝ වෙනත් තොරතුරු, නීත්‍යානුකූල සමාවට කරුණක් නොමැතිව, ලබාගන්නා හෝ ස්වකීය භාරයේ නැතහොත් පාලනයේ තබාගන්නා හෝ සන්තකයේ තබාගන්නා හෝ පාලනයට ලබාගැනීමට හෝ සන්තකයේ තබා ගැනීමට තැත් කරන කවරෙකු වුවද වරදකට වරදකරු විය යුතු අතර නීත්‍යානුකූල සමාවට කරුණු ඔප්පු කිරීමේ භාරය එකී තැනැත්තා වෙත පැවරෙන්නේය.
- **රෙගුලාසි** 37 - රජ්‍ය ආරක්ෂාව හෝ මහජන සාමය රැකීමට හානිකර විය හැකි හෝ ආණ්ඩුව කෙරෙහි වෛරයෙන් යුත් හෝ අපහාසයෙන් යුත් හැඟීම් ඇවිස්සීමට, ඊට අනුබලදීමට හෝ ධෛර්යය දීමට ඉඩ ඇති හෝ ආණ්ඩුව බිඳ හෙළීම සඳහා යම් පියවරක් ගැනීමට කෙළින්ම හෝ අන්‍යාකාරයකින් යම් තැනැත්තෙකු පෙළඹවීමට ඉඩ ඇති යම් පොතක්, ලේඛනයක් හෝ යම් ලියවිල්ලත් හෝ කරුණු සැලකිරීමක් අඩංගු යම් ලිපියක්, නීතියානුකූල බලයක් හෝ සමාවට සෑහෙන කරුණු නොමැතිව තම සන්තකයෙහි, භාරයේ හෝ පාලනයෙහි තබාගන්නා කවරෙකු වුවද වරදකට වරදකරු විය යුතු අතර නීත්‍යානුකූල බලය හෝ සමාවට කරුණු ඇති බවට ඔප්පු කිරීමේ භාරය එම තැනැත්තා වෙත පැවරෙන්නේය.
- **රෙගුලාසි - 45** නීත්‍යානුකූල බලයකින් තොරව වෙනත් තැනැත්තෙකුට මරණ තර්ජනයක් හෝ ශාරීරික හිංසනයක් ස්ථාපිත කරන හෝ යම් ප්‍රකාශයක් හෝ රූපමය ඉදිරිපත් කිරීමක් අඩංගු යම් ලියවිල්ලක් ඔහු සන්තකයේ තබා සිටින හෝ මුද්‍රණය කරන හෝ බෙදාහරින, මරණ බවට හෝ ශාරීරික හිංසා වලට භාජනය කරනු ලබන බවට ලිඛිත වචන වලින් හෝ වාචිකව සංඥා මගින් හෝ හැසිරීමෙන් හෝ තර්ජනය කොට ඒ වෙනත් තැනැත්තා දරන යම් ධූරයකින් ඉල්ලා අස් වෙන ලෙසට හෝ යම් දේශපාලන පක්ෂයකට බැඳෙන ලෙස හෝ යම් රජයේ නිලධාරියෙකු හෝ අත්‍යාවශ්‍ය සේවයක යෙදී සිටින තැනැත්තෙකුගේ කාර්යය උල්ලංඝනය වන පරිදි යම් ක්‍රියාවක් කරන ලෙස හෝ නොකරන ලෙස එම තැනැත්තා හෝ නිලධාරියා මරණ බවට හෝ ශාරීරික හිංසා වලට භාජනය කරනු ලබන බවට ලිඛිත වචන වලින් හෝ වාචිකව සංඥා මගින් හෝ හැසිරීමෙන් හෝ තර්ජනය කොට එම තැනැත්තා හෝ නිලධාරියා පොළඹවීමට තැත්කරන්නා වූ යම් තැනැත්තෙක් මෙම නියෝග යටතේ වරදක් කරන අතර මහාධිකරණ ඉදිරියේ පවත්නා නඩු විභාගයකින් අනතුරුව වරදකරුවෙකු කෙරණු පසුව මරණ දණ්ඩනයෙන් දඬුවම් කරනු ලැබිය යුතුය.

**10. හදිසි නියෝග යටතේ පුද්ගලයෙකු රඳවා තබා ගත හැක්කේ කෙසේ ද?**

- **රෙගුලාසි 19(1) -** රජ්‍ය ආරක්ෂාවට හෝ මහජන සාමය පැවැත්වීමට හෝ අත්‍යාවශය සේවා පවත්වාගෙන යාමට හානි පමුණුවන යම් ආකාරයකින් ක්‍රියා කිරීමෙන් හෝ මෙම නියෝග වල 44 ඡේදයෙහි (අ) අනුඡේදයෙහි හෝ (ආ) අනුඡේදයෙහි හෝ 25 වන නියෝගයේ විධිවිධාන වලින් යම් විධිවිධානයකට පටහැනිව ක්‍රියාකිරීමෙන් යම් තැනැත්තෙකු වැළැක්වීමේ අදහසින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් එලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය යැයි රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ තැනැත්තා අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම නියම කරන නියමයක් ඔහු විසින් කරනු ලැබිය හැකිය. තවද රෙගුලාසි 19(10) ප්‍රකාරව 1 වන ඡේදය යටතේ කරනු ලබන නියෝගයක් කිසිම හේතුවක් නිසා යම් අධිකරණයකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතුය.

19 (1) යටතේ රඳවාගනු ලබනු ඇති ඕනෑම පුද්ගලයෙකුට එසේ රඳවාගනු ලබනු ඇත්තේ පොලිස්පතිවරයා විසින් අවසර දෙනු ලබන ස්ථානයක සහ ඔහු විසින් දෙනු ලබන උපදෙස් ප්‍රකාරව හෝ බන්ධනාගාර ආඥා පනත යටතේ ස්ථාපිත කරන ලද බන්ධනාගාරයකය (රෙගුලාසි 19(3)).

11. **මෙම රෙගුලාසි යටතේ පුද්ගලයෙකු රඳවා තබාගත හැක්කේ කවුරුන් විසින් ද?**

ඕනෑම පොලිස් නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයෙකු **(රෙගුලාසි 19(2)).**

12. **හදිසි අවස්ථා රෙගුලාසි යටතේ කොපමණ කාලයක් පුද්ගලයකු රඳවා තබාගත හැකි ද?**

මෙම රෙගුලාසි යටතේ යම් පුද්ගලයෙකුඅත්අඩංගුවට ගනු ලැබූ දින සිට දින 90ක් නොඉක්ම වනකාල පරිච්ඡේදයක් රඳවාතබා ගනු ලැබිය හැකිය. එම කාල පරිච්ඡේදය අවසානවීමට පෙර එම පුද්ගලයා අදාළ බලතල සහිත අධිකරණයක් හමුවට පමුණුවාබන්ධනාගාර ආඥා පනත අනුව ස්ථාපිත කරන ලද බන්ධනාගාරයක රඳවනු නොලැබුවහොත් දින 90 අවසානයේ ඔහු රඳවනු ලබන ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් ඔහු නිදහස් කල යුතුවේ. **(රෙගුලාසි 21 (2)).**

- යම් පුද්ගලයෙකු උපරිම වශයෙන් වසරක කාලයක් රඳවා තබාගත හැකිය **(රෙගුලාසි 19(1)).**

13. **රඳවාතබා ගැනීමේ නියෝගයකට විරෝධය පලකිරීමේ ක්‍රියාපටිපාටිය කුමක් ද?**

**රෙගුලාසි 19(4)** යටතේ රඳවාගනු ලැබූ පුද්ගලයෙකුහට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ පුද්ගලයන්ගෙන් සමන්විත වනඋපදේශක කමිටු එකක් හෝ වැඩිගණනක් වෙත තම විරෝධයන් ගොනුකළ හැකිය. එවැනි විරෝධයපෑම් සම්බන්ධයෙන් වන වාර්තාව ඉන්පසු උපදේශක කමිටුව විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඉදිරිපත් කරනු ලැබනු ඇති අතර ඔහු විසින් එම වාර්තාව සලකා බැලීමෙන් පසු එම නියෝගය අහෝසි කල හැකිය. මෙහිදී සැලකිල්ලට ගතයුතු කරුණක් වන්නේ මෙම ප්‍රතිපාදනයන් විසින් උපදේශක කමිටුවට පත්කල යුත්තේ කවුරුන්ද යන්න හෝ ඔවුන් තෝරාගත යුතු ආකාරය පිළිබඳව කිසිදු මග පෙන්වීම අත්වැලක් නොසපයන බවයි. එසේ රඳවාගැනීමේ නියෝගයක් නිකුත් කරනු ලැබ ඇති පුද්ගලයකු හට, ලිඛිතව ජනාධිපතිවරයාට කරුණු ඉදිරිපත් කිරීමේ "අවස්ථාවක් ප්‍රායෝගික වශයෙන් හැකිතරම් ඉක්මනින් ලබාදීම"ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කාර්යයවේ **(රෙගුලාසි 19(5)).**

**රෙගුලාසි 19(9)** - මේ නියෝගයේ 1 වන ඡේදය යටතේ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබුවේද ඒ තැනැත්තා මේ නියෝගය වල 75 වන නියෝගය යටතේ තහනම් කරනු ලැබූ සංවිධානයක සාමාජිකයෙකු බව හෝ සාමාජිකයෙකු වී සිටි බවට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ලිඛිතව සහතික කරන අවස්ථාවක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් මේ නියෝගයේ (4),(5),(6) හා (8) යන ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය.

**14. හදිසි නීති යටතේ දේපළ තහනමට ගැනීමට සහ අත්අඩංගුවට ගැනීමට බලය ඇත්තේ කාටද?**

රෙගුලාසි 20(1) - යම් රජයේ නිලධරයෙකු හෝ ශ්‍රී ලංකා යුධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවුක හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයෙකු හෝ මේ නියෝගය යටතේ ක්‍රියා කිරීමට ජනාධිපතිවරයා විසින් බලය දෙනු ලැබූ අන් කිසි තැනැත්තෙකු හෝ විසින් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් කරන්නා වූ හෝ කරනු ලැබූ නැතහොත් වරදක් හා සම්බන්ධ හෝ වරදක් කරන බවට හෝ කරනු ලැබූ බවට සැක කරනු ලැබීමට යුක්ති සහගත හේතු ඇත්තා වූ තැනැත්තෙකු සෝදිසි කළ හැකිය. එසේ සෝදිසි කිරීමේ කාර්යය සඳහා එකී තැනැත්තෙකු රඳවා තබාගත හැකිය. නැතහොත් වරෙන්තුවක් නොමැතිව එකී තැනැත්තෙකු සිරභාරයට ගත හැකිය. තව ද වරද සිදු කිරීමේදී හා ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ කුමන අන්දමේ හෝ යම් වාහනයක්, යාත්‍රාවක්, භාණ්ඩයක් ද්‍රව්‍යයක් හෝ දෙයක් සෝදිම් කිරීම, තහනමට ගැනීම, ඉවත් කිරීම හා රඳවා තබා ගැනීම කළ හැකිය

15. **අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාපටිපාටිය කුමක් ද?**

- අත්අඩංගුවට ගැනීම සිදුකරන නිලධාරියා පොලිස් නිලධාරියෙකු වන විටදී එම අත්අඩංගුවට ගැනීම සිදුවූ කොට්ඨාශය භාර පොලිස් අධිකාරීවරයා වෙත ද, නිලධාරියා සන්නද්ධ හමුදාවක සාමාජිකයෙකු වන විටදී අත්අඩංගුවට ගැනීම සිදුවූ ප්‍රදේශයේ එම හමුදාවේ අණදෙන නිලධාරියා වෙත ද අත්අඩංගුවට ගත්වේලාවේ සිට පැය 24ක් ඇතුලත අත්අඩංගුවට ගැනීම වාර්තා කළ යුතුය **(රෙගුලාසි 20(9)).**
- අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයාගේ කාලත්‍රයා, පියා, මව හෝ කිට්ටු ඥාතියකු වෙත, ලේකම්වරයා විසින් නිශ්චිත කොට දක්වන පෝරමයක් මගින් අත්අඩංගුවට ගැනීම පිළිබඳව වන ලේඛනයක් නිකුත් කිරීම අත්අඩංගුවට ගැනීම සිදුකරන නිලධාරියා විසින් සිදුකළ යුතුය. කෙසේ නමුත් එසේ කළ නොහැකිවිටකදී අත්අඩංගුවට ගන්නා නිලධාරියාගේ කාර්යය විය යුත්තේ, ඔහු පොලිස් නිලධාරියෙකු නම් තොරතුරු පොතෙහි සටහනක් යෙදීමයි. ඔහු හමුදා නිලධාරියකු නම් එසේ ලියවිල්ලක් නිකුත්කල නොහැක්කේ ඇයි ද යන්න පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධාරියා වෙත වාර්තා කිරීම කල යුතු වන අතර එය තොරතුරු පොතෙහි වාර්තා කල යුතුවේ. **(රෙගුලාසි 20(9))**
- යම් පුද්ගලයෙකු සාධාරණ හේතුවකින් තොරව ඉහත (9) පරිදි අත්අඩංගුවට ගැනීමක් පිළිගනිමින් ලියැවිල්ලක් නිකුත් කිරීමට අසමත් වේ නම් හෝ හිතාමතාම එසේ ප්‍රතිපාදනයන්හි නියමකර ඇති පරිදි තොරතුරු පොතෙහි සටහනක් යෙදීමට ක්‍රියාකර නොමැත්තේ නම් ඔහු වරදකට වැරදිකරුවෙකු වනුඇති අතර මහාධිකරණය ඉදිරියේ නඩුවිභාගයකින් පසු වැරදිකරු කරනු ලැබූ විටක අවුරුදු දෙකක් දක්වා වන සිරදඬුවම් කාලයකට සහ දඩයකට යටත් කළ හැකි වනු ඇත. **(රෙගුලාසි 20(10))**
- 19 වන රෙගුලාසි යටතේ අත්අඩංගුවට ගනු ලැබ රඳවාගනු ලබන පුද්ගලයෙකු, ඒ ඒ සිදුවීමෙහි තත්ත්වයන් ද සැලකිල්ලට ගෙන, එවැනි අත්අඩංගුවට ගැනීමෙන් <u>දින 30 කට</u> වැඩි නොවන කාලයක් තුලදී වන පරිදිසාධාරණ කාලයක් තුළ ඕනෑම මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි පුද්ගලයෙකු ඇපමත නිදහස් කිරීම නීතිපතිවරයාගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව මහේස්ත්‍රාත්වරයා විසින් සිදු නොකළ යුතුය.

16. **හදිසි අවස්ථා රෙගුලාසි යටතේ නීතිපතිවරයා හට ලබාදෙනු ලැබ ඇති බලතල මොනවාද?**

මෙම රෙගුලාසි මගින් නීතිපතිවරයා හට පුළුල් බලතල පවරනු ලැබ තිබේ. පහත සඳහන් කොට ඇති මෙම ඇතැම් බලතල, විශේෂයෙන්ම මහේස්ත්‍රාත්වරයකු විසින් සැකකරුවෙකු නිදහස් කල හැක්කේ නීතිපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසුවය යන්න වැනි තත්ත්වයන් අධිකරණයේ බලය බරපතල ලෙස ආක්‍රමණය කිරීමක් වේ.

මෙහිදි "නීතිපතිවරයා" යන්නට සොලිසිටර් ජනරාල්වරයා, ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයා, අතිරේක සොලිසිටර් ජනරාල්වරයා,ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා, නියෝජ්‍ය සොලිස්ටර් ජනරාල්වරයා, ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥවරයා, රජයේ නීතිඥවරයා හෝ නීතිපතිවරයා විසින් බලය පවරනු ලැබූ ඕනෑම නීතිඥවරයකු ඇතුළත් වේ. **(රෙගුලාසි 2(1))**

- නීතිපතිවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව සැකකරුවෙකු ඇපමත නිදහස් කිරීම මහේස්ත්‍රාත්වරයෙකුට කළ නොහැකිය **(රෙගුලාසි 21(1))**
- රෙගුලාසි 59 හි 9 වන පරිච්ඡේදය යටතේ නීතිපතිවරයා විසින් සාක්ෂි වාර්තා සහ අනෙක් ලියවිලි ලැබෙන විට ඔහු,
  (අ) ඔහුට අවශ්‍ය වන වැඩිදුර ද්‍රව්‍යයය හෝ තොරතුරු සඳහා ඉල්ලීමක් කරනු ඇත.

ආ) යම් වරදවල් සිදු කිරීම අනාවරණය කොට ඇති බවට්ඔහු සෑහීමට පත් වන්නේ නම්,

i) **1979** අංක **15** දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ **XIV** හෝ වන හෝ **XV** පරිච්ඡේද යටතේ නඩු පැවරීමට විධින කිරීම හෝ

ii) **1979** අංක **15** දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ **393** වගන්තියේ **(7)** වන උප වගන්තියේ විධිවිධාන යටතේ කටයුතු කරගෙන යාම හෝ නීත්‍යානුකූල වන්නේය.

**රෙගුලාසි** 65 -

(1) - 25 වන නියෝගයේ (3) වන ඡේදයේ විධිවිධාන වලට යටත්ව
(අ) යම්කිසි හදිසි අවස්ථා නියෝගයකට එරෙහි වරදක් සඳහා ; හෝ
(ආ) ඒ නියෝගය යටතේ යම් බලයක් හෝ කාර්යයක් කෙළින්ම හෝ අන්‍යාකාරයකන් ක්‍රියාත්මක කිරීමේදී හෝ ඉටු කිරීමේදී හෝ කල්පිත ක්‍රියාත්මක කිරීමේදී හෝ ඉටු කිරීමේදී, කිරීමෙන් හෝ නොකර හැරීමෙන් උද්ගත වූ තැනහොත් ඇති වූ වරදකින් සංයුක්ත වන ක්‍රියාව හෝ නොකර හැරීම වෙන යම් ලිඛිත නීතියක් යටතේ තැනැත්තන් විසින් කරනු ලබන හෝ කරන ලදැයි කියන වරදක් සඳහා ; හෝ

මහේස්ත්‍රාත් අධිකරණයක කිසිම නඩු පැවරීමක්, නීතිපතිවරයා විසින් ලියවිල්ලක් දෙනු ලබන අනුමැතිය හෝ ඒ අනුමැතිව මගින් ඇතිව හෝ මිස නොකළ යුතුය.

**17. සැකකරුවෙකු විසින් කරන ලද ප්‍රකාශ සාක්ෂි නීතිය යටතේ වලංගු වන්නේ කෙසේ ද?**

- **රෙගුලාසි 77 -** යම් හදිසි අවස්ථා නියෝගයක හෝ ඒ යටතේ කරන ලද යම් නියමයක හෝ විධානයක විධිවිධාන යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් නීතිපතිවරයාගේ ලිඛිත අනුමැතිය මගින් හෝ එම අනුමැතිය ඇතිව හෝ මිස, කිසිම අධිකරණයක නොපැවරිය යුතුය.
- **රෙගුලාසි 67(1) -** හදිසි අවස්ථා නියෝග යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුගේ නඩු විභාගයකදී ඒ තැනැත්තා විසින් කරන ලද ප්‍රකාශයක් පාපොච්චාරණයක් වුවත්, නැතත්, එය කරන ලද අවස්ථාවේදී එම තැනැත්තා සිටියේ පොලිස් නිලධාරියෙකුගේ රැකවරණයේ වුවත්, නැතත්, එම ප්‍රකාශය මහේස්ත්‍රාත්වරයා ඉදිරිපිටදීම කරන ලද්දක් වුවත්, නැතත්, එම ප්‍රකාශය සාක්ෂි ආඥා පනතේ 24 වන වගන්තිය යටතේ අදාළ නොවන්නේ නම් පමණක්ම ඔහුට විරුද්ධව ඔප්පු කළ හැකිය.
- එසේ වුවද, ඒ ප්‍රකාශය, තනතුරින් සහකාර පොලිස් අධිකාරී කෙනෙකුට වඩා පහළ නිලධාරියෙකුට කරන ලද්දක් නම්, එවැනි කිසිම ප්‍රකාශයක් එම තැනැත්තාට විරුද්ධව ඔප්පු නොකළ යුතුය.

**18. හදිසි අවස්ථා රෙගුලාසි යටතේ සංවිධානයක් තහනම් කරනු ලැබිය හැක්කේ කෙසේ ද?**

**රෙගුලාසි 75(1)** මගින් ප්‍රකාශ වන පරිදි පහත අරමුණු උදෙසා සංවිධානය හෝ එහි සාමාජිකයන් ක්‍රියාකාරීවීමේ හෝ ඒ සඳහා ඔවුන් භාවිතාවීමේ අනතුරක් ඇතැයි යන්න ජනාධිපතිවරයාගේ මතය වන විටඃ

අ) ජාතික ආරක්ෂාව, මහජන සාමය හෝ අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට හානිකර වන අරමුණු සඳහා හෝ

ආ) රෙගුලාසි 42 පරිච්ඡේද (2) උපපරිච්ඡේද (b) හෝ රෙගුලාසි 25 උප පරිච්ඡේද (a) සිට (g) දක්වා හී සඳහන් වන ඕනෑම අරමුණක් සඳහා,

ජනාධිපතිවරයාට ගැසට් පත්‍රයෙහි පලකරනු ලබන නියෝගයක් මගින් එම සංවිධානය තහනම් කළසංවිධානයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට හැකිය.

19. **යම් ස්වාධීන අධිකාරියක් මගින් රෙගුලාසීන් නිරීක්ෂණය කිරීමට හෝ අධීක්ෂණය කිරීමට හදිසි අවස්ථා රෙගුලාසි මගින් ඉඩකඩ සළසා තිබේද?**

නැත. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව වැනි යම් ස්වාධීන අධිකාරියක් මගින් සිදුකරනු ලබන අධීක්ෂණයක් රෙගුලාසියෙහි නොපවතී.